# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2013 නොවැම්බර් මස 05 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.45 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු අයි.ඒ. සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බල ශක්ති සහ වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා) |
| ගරු ජගත් අංගගේ | (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අමරසේකර, ශිරන්ත | ජයකොඩි, සිසිර | මල්ලව, නෙලුක් |
| අම්ජාඩ්, එම්.එම්.එම්. | ජයතිස්ස, නලින්ද | මංචනායක, කිත්සිරි |
| අල්මේදා, මහේෂ් | ජයනාත්, ගුණසිරි | මැන්දිස්, සුමිත් ලාල් |
| අබේරත්න, පී.ඩී. | ජයසිංහ, ලයනල් | යූසුෆ්, ඒ.එම්. |
| උඩවත්ත, කීර්ති | තිලකරත්න, හෂාන් | රහීම්, එම්.එස්.එම්. |
| උඳුගොඩ, ප්‍රදීප් | තිලකසිරි, ගාමිණී | රහුමාන්, මොහොමඩ් මුජිබර් |
| කහටපිටිය, කිත්සිරි | ද සිල්වා, ගාමිණී | රාජකරුණා, හර්ෂණ |
| කාරියවසම්, කීර්ති | ද සිල්වා, ජයන්ත | රාජපක්ෂ, දිලිප් කුමාර |
| කාරියවසම්, ලයනල් | ද සිල්වා, සිරිකමල් ෆිලීෂියන් | රාජේන්ද්‍රන්, එස්. |
| කුමරගුරුබරන්, එන්. | ද සිල්වා, සේනක දමයන්ත | රාම්, පංචරත්නම් |
| කුමාර, ජගත් | දේවප්‍රිය, ඉසුර | ලංකාතිලක මැතිනිය, අශෝකා |
| කුරුවිටගේ, මහින්ද | නිසාම්ඩීන්, එම්. අර්ෂාද් | වනිගරත්න, ලලිත් |
| කුලරත්න, ලාල් | පතිරණ, සරත් | වරාගොඩ, රෙහෙන්සිරි |
| කොටකදෙනිය, එච්.එම්.ජී.බී. | පියනන්ද ස්ථවිර, පූජ්‍ය තෙඹුවන | වැලිවත්ත, ජනක් දීපාල් |
| කොස්තා, ජේම්ස් ප්‍රිම්ලස් | පාදුක්ක, නිරෝෂන් | විජේරත්න, උදේන |
| කෝරළගේ, යසපාල | පෙරේරා, තුෂාර | විජයරත්න, මොරිස් |
| ගමගේ, සලෝචන | පෙරේරා, දයාකාන්ත | සරණලාල්, චන්ද්‍රසෝම |
| ගුණරත්න, උපාලි | පෙරේරා, ප්‍රදීප් | සුමනසේකර, සරත් කුමාර |
| ගුණවර්ධන මැතිනිය,කෝකිලා හර්ශනී | පෙරේරා, මෙරිල් | සූරියබණ්ඩාර, ජානක |
| ගුණසේකර, වික්‍රම් | ප්‍රනාන්දු, කිත්සිරි | සෙනෙවිරත්න, රොජර් |
| චන්ද්‍රභානු, අධිකාරම්ගේ | ප්‍රනාන්දු මැතිනිය, රෝස් | ෆයිරූස්, මොහොමඩ් |
| චන්ද්‍රරත්න, නිමල් | බෙත්මගේ, හෙක්ටර් | ෆවුසි එම්. නවුසර් |
| ජයකොඩි, චන්දන | මතුගමගේ, සුගත් | ෆායිස්, මොහොමඩ් |

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු රංජිත් සෝමවංශ | (නියෝජ්‍ය සභාපතිතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| එල්ලාවල, ලලිත් | ද සිල්වා, පියල් නිශාන්ත | |
| කුරුප්පු, කාමල් | ද සොයිසා, විජයමුණි සුමිත් | පෙරේරා, පෝල් |
| ජයවර්ධන, නිහාල් | පීරිස්, නිමල් ආර්. | පෙරේරා, ශ්‍රීනාත් |
| ද සිල්වා, අනන්ද හරිශ්චන්ද්‍ර | පෙරේරා, අ. ශ්‍රීනාත් ම. | ප්‍රියන්ත, විජිත් |

මවුජුඩ්, අජ්මාල්
රාජපක්ෂ, තිලකරත්න
රාජපක්ෂ, වරුණ දීප්ති
රූපසිංහ, ආනන්ද රංජිත්
රොද්‍රිගු, රන්දීර්
ලක්තිලක, ශිරාල්
වර්ණකුමාර, ලලිත්
විජේමාන්න, ලක්ෂ්මන්
විජේසුන්දර, ශාලිත
විජේසේකර, රවී
සකලසූරිය මැතිනිය, චන්ද්‍රිකා ගුණවර්ධන
යූ.ජී.සිරිවර්ධන මැතිනිය, සන්ධ්‍යා
සිල්වා, අමල්

## 01. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

2013.10.22 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 02. නොපැමිණ සිටීමේ අවසරය :

*"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

## 03. පළාත් සභාවේ රැස්වීම I

උදය ගම්මන්පිළ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*" 2013.10.22 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2013 නොවැම්බර් මස 26 වන දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු අතර, 2013 නොවැම්බර් මස 19 වන දිනය (අඟහරුවාදා) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සැලකිය යුතුය."*

## 04. පළාත් සභාවේ රැස්වීම II

උදය ගම්මන්පිළ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*" 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයක් සම්බන්ධයෙන් මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා 2013.10.22 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවය ද සැලකිල්ලට ගෙන, 2013 දෙසැම්බර් මස 03, 04, 05, හා 06 දිනයන්, 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයක් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 05. පළාත් සභාවේ කටයුතු I

උදය ගම්මන්පිළ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*" මින් පෙර කිනම් තීරණයක් එළඹුණද ඒ කිසිත් නොතකා 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පළාත් සභාවට ඉදිරිපත් කිරීම 2013.11.26 දින සිදු කළ යුතුය."*

## 06. පළාත් සභාවේ කටයුතු II

උදය ගම්මන්පිළ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*" අද දින න්‍යාය පත්‍රයේ අංක XI පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ වූ වැඩ කටයුතුවල කාර්යය අනුපිළිවෙළ පිළිවෙළින් විෂයය අංක 03, 01 හා 02 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා විසින් 2013.10.22. වන දින පළාත් සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව යළිත් සභාභිමුඛ කරන ලදී.

*"රාජ්‍ය සේවයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී එම කාර්ය මණ්ඩලය තුළ සිටින පහළම තනතුර දරන්නා වන්නේ කම්කරුවායි. එම කම්කරුවා මීට පෙර තනතුරු සඳහා ඇතුළත්වීමේදී අවම අධ්‍යාපන මට්ටමක් පැවතියද, එය රාජ්‍ය සේවයට ඇතුළත්වීමට ප්‍රමාණවත් විය. නමුත් මේ වනවිට රජය තීරණය කර ඇති පරිදි කම්කරු තනතුරු ලබා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණයෙන් විෂයයන් 06 සමත්වී (ගණිතය ඇතුළුව) සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුය. මෙය රටේ සාමාන්‍ය පෙළ අපේක්ෂකයින්ගෙන් 50% කට පමණ සෘජු ලෙසම බලපාන තීන්දුවකි. මන්ද යත්, සාමාන්‍ය පෙළ පරීක්ෂණයේදී ගණිතය විෂයය අසමත්වන කණ්ඩායම 50% කට ආසන්නය. එයින් ගම්‍ය වන එක් දෙයක් වන්නේ, රටේ ශිෂ්‍ය ගහණයෙන් 50% කට රාජ්‍ය සේවයේ අවම රැකියාව හෝ ලබා ගැනීමට අවස්ථාවක් නොමැතිවීමයි. මෙය තුළ නිර්මාණය වන සමාජ අර්බුදය අනාගතයේ මහත් ව්‍යසනයක් ඇති කරනු ඇත. එම නිසා බස්නාහිර පළාත් රාජ්‍ය සේවාව සඳහා කම්කරු ශ්‍රේණියට බඳවා ගැනීමේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටීම පමණක් සුදුසුකමක් සේ සලකා කටයුතු කරන ලෙස මෙම ගරු සභාව විසින් යෝජනා කර සිටින්නේය."*

***පූ.භා. 10.32 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.34 ට යළිත් රැස් විය.***

***පූ.භා. 11.55 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

***අ.භා. 12.28 ට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් සභාවේ ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණ පූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුව, ගණපූරණය ඇති නොවූයෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනවිය] විසින් රැස්වීම තාවකාලිකව අත්හිටුවන ලදුව, අ.භා. 12.43 ට ගරු සභාපතිතුමාගේ [සුනිල් විජේරත්න මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

***එවිටත් සභාවේ ගණපූරණය නොවූයෙන්, පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳ සභාවේ එකඟත්වය විමසීම පමණක් සඳහා ඊළඟ සභාවට යොමු කරමින් ,***

## 08. 12 (1) රීතිය යටතේ කල් තැබීම :

ගරු සභාපතිතුමා විසින් 12 (1) රීතිය යටතේ පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව පළාත් සභාව, අ.භා. 12.48 ට, 2013 නොවැම්බර් මස 26 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,<br>
ලේකම්,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.11.05<br>
බස්නාහිර පළාතේ පළාත් සභාව,<br>
5 වන මහල,

බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කුමා/05
Minuts 2013.11.05 - Hansard Section